
# ලංකාවේ වධක බිම්



- හමුදා වධකාගාර
- පොලිස් වධකාගාර
- නාවික වධකාගාර
- "පුනරුත්ථාපන" කඳවුරු
- පාසැල් හා අධ්‍යාපන ආයතන
- අතුරු හමුදා කඳවුරු
- වෙනත් සිවිල් ගොඩනැගිලි
- නාඳුනන අපරාධකාරී ඒකක

JDS
Journalists for Democracy in Sri Lanka

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

## 1971

මෙම වකවානුවේදී ශ්‍රී ලංකාවේ සියලු පොලිස් ස්ථාන වධහිංසා පැමිණවීම සඳහා යොදාගනු ලැබුණි. සිතියමක දැක්වීමට නොහැකි තරම් ඒවා විශාල ප්‍රමාණයක් තිබේ. 'පුනරුත්ථාපනය' සඳහා යොදාගත් සරසවි දෙකක් තුළ ද වධහිංසා දීම සිදුවිය. පොලිස් සිරමැදිරිවල රඳවා සිටි රැඳවියන් කොළඹ 7 ලොන්ඩන් පෙදෙසේ හා විජේරාම මාවතේ පිහිටි රහස් පොලිස් කාර්යාලවලට නිරන්තරයෙන් ගෙනගොස් වධහිංසා හා ප්‍රශ්නකිරීම්වලට බඳුන් කෙරුණි.

## 1987-89

පොලිස් ස්ථාන විශාල ප්‍රමාණයක් වධහිංසා සඳහා මේ වකවානුවේදී යොදා ගැනුණි. සිතියමක දැක්වීමට නොහැකි තරම් ඒවා සංඛ්‍යාත්මකව අධික ය. පහතින් දැක්වෙන්නේ ඇතැම් හමුදා කඳවුරු ය.

### ◆ "පුනරුත්ථාපන" කඳවුරු

1. පොළොන්නරුවේ රාජකීය විදුහලේ විවෘත කඳවුර

### ● සිංහල අතුරු හමුදා කණ්ඩායම්

2. බටලන්ද නිවාස සංකීර්ණය (බියගම, සපුගස්කන්ද පොලිසිය හා ප්‍රා කණ්ඩායම (PRRA).

### ● හමුදා වධකාගාර

**කොළඹ දිස්ත්‍රික්කය**

3. කොළඹ සරසවි නීති පීඨය - හමුදා බුද්ධි අංශය සහ ප්‍රා අතුරු හමුදා කණ්ඩායම
4. හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාගාරය (ඒකාබද්ධ හමුදා මෙහෙයුම), හැව්ලොක් ටවුන්
5. යඨාරෝ කැෆටේරියා, තිඹිරිගස්යාය, කොළඹ 5
6. ඉසුරුපාය (රජයේ කාර්යාල සංකීර්ණය), බත්තරමුල්ල
7. සාලාව තුනීලැලි සංස්ථා පරිශ්‍රය හමුදා කඳවුර, කොස්ගම
8. ඔරුවල වානේ සංස්ථා පුහුණු ආයතන හමුදා කඳවුර
9. ටිරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාගාරය, මොරටුව
10. මත්තේගොඩ හමුදා කඳවුර

**රත්නපුර දිස්ත්‍රික්කය**

11. සෙවණ හමුදා කඳවුර, ඇඹිලිපිටිය
12. කුට්ටිගල හමුදා කඳවුර, ඇඹිලිපිටිය
13. රත්නපුර මහ නගර සභා ගොඩනැගිල්ල
14. කුරුවිට හමුදා කඳවුර.

**මාතර දිස්ත්‍රික්කය**

15. ජොනී ඩේල් හමුදා කඳවුර, කෙලිජ්ජවිල
16. එළියකන්ද හමුදා කඳවුර
17. මුලටියන හමුදා කඳවුර
18. වැලිගම හමුදා කඳවුර
19. හෙට්ටියාවල හමුදා කඳවුර
20. තලල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

21. අඟුණකොලපැලැස්ස ප්‍රජා ශාලාව
22. මිද්දෙණිය හමුදා කඳවුර

**කළුතර දිස්ත්‍රික්කය**

23. බේරුවල කෘෂිකර්ම මධ්‍යස්ථානය
24. පැලවත්ත හමුදා රැඳවුම් කඳවුර (1985දී විවෘත සිර කඳවුරක් වශයෙන් ආරම්භ කළ මෙය 1987දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගත් සිරකරුවන් රැඳවීමටත්, 1989න් පසු වධහිංසනය සඳහාත් යොදාගැණුනි.

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

25. හෙට්ටිපොල හමුදා කඳවුර
26. වැහැර හමුදා කඳවුර

ගාල්ල දිස්ත්‍රික්කය

27. කොටිගල හමුදා කඳවුර

අනුරාධපුර දිස්ත්‍රික්කය

28. පණ්ඩුලගම හමුදා කඳවුර
29. යකල්ල හමුදා කඳවුර
30. කැකිරාව හමුදා කඳවුර
31. සාලියපුර හමුදා කඳවුර

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

32. මින්නේරිය පෙහෙකම්හල
33. සේවාගම හමුදා කඳවුර
34. පොළොන්නරුව මහසෙන් ගොඩනැගිල්ල
35. මැදිරිගිරිය පල්ලියගොඩැල්ල හමුදා කඳවුර
36. මැදිරිගිරිය මීගස්වැව හමුදා කඳවුර
37. මැදිරිගිරිය මහා විද්‍යාලය
38. ගිරිතලේ හමුදා කඳවුර

**මහනුවර**

39. ශාන්ත සිල්වෙස්තර විදුහල
40. ජාතික සමූපාකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල
41. හිල්ඩා ඔබේසේකර ශාලාව, පේරාදෙණිය සරසවි පරිශ්‍රය
42. හමුදා පුහුණු මධ්‍යස්ථානය, රන්දෙණිගල
43. උඩුව හමුදා කඳවුර, ගලගෙදර
44. පල්ලෙකැලේ හමුදා කඳවුර ඉදිරිපිට මහවැලි ගඟෙන් ඔබ්බෙහි වූ ස්ථානයක්
45. සිංහ රෙජිමේන්තු කඳවුර, යටිනුවර වීදිය

**මාතලේ දිස්ත්‍රික්කය**

47. මාතලේ රජයේ තානායම (ගජබා රෙජිමේන්තු සම්බන්ධීකරණ කඳවුර)
48. විජය විද්‍යාලය, මාතලේ
49. මත්තව හමුදා කඳවුර, වරකාවල
50. නාවුල හමුදා කඳවුර
51. ඔවිලිකන්ද හමුදා කඳවුර
52. කටාරන්තැන්න බංගලා හමුදා කඳවුර, රත්තොට
53. උකුවෙල හමුදා කඳවුර
54. උඩුපිහිල්ල හමුදා කඳවුර
55. හෙට්ටිපොළ හමුදා කඳවුර
56. මාතලේ, නාගොල්ල පාරේ කාර්මික පුහුණු පාසැල
57. ක්‍රිස්තුදේව විද්‍යාල හමුදා කඳවුර
58. පැල්වෙහෙර රජයේ ගොවිපොළ
59. බණ්ඩාරපොල හමුදා කඳවුර
60. කැකිරාව හමුදා කඳවුර
61. රත්තොට හමුදා කඳවුර
62. කිඹිස්ස හමුදා කඳවුර

**බදුල්ල දිස්ත්‍රික්කය**

63. වැලිමඩ වයි.එම්.සී.ඒ. ගොඩනැගිල්ල
64. අඹගස්දෝව කඳවුර
65. බණ්ඩාරවෙල නගර සභා ගොඩනැගිල්ල
66. බදුල්ල රේස්කෝස් කඳවුර (හමුදා සහ ක්ෂණික විහිදුම් බලකාය)
67. බණ්ඩාරවෙල හමුදා කඳවුර
68. බෙරගල හමුදා කඳවුර, හපුතලේ
69. බෙරතල සමර් ෆැෂන් ඇඟලුම් කම්හල, හපුතලේ
70. පිංඅරාව හමුදා කඳවුර, බදුල්ල
71. හාලිඇළ මෝටර්ස් ගොඩනැගිල්ල, බදුල්ල
72. සේනානායක ක්‍රීඩාංගන විශේෂ කාර්ය බලකා කඳවුර

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

73. වී අලෙවි මණ්ඩල ගබඩාව, වලපනේ
74. වලපනේ තේ කම්හල (වත්මන් පළාත් සභා ගොඩනැගිල්ල)
75. සිනේස්ටාර් සිනමා ශාලාව නුවරඑළිය
76. නුවරඑළිය නගර ශාලාව
77. ලිදුල තේ කර්මාන්ත ශාලාව, තලවකැලේ

**ගම්පහ දිස්ත්‍රික්කය**

78. යක්කල මහා විදුහල කඳවුර
79. කොමාන්ඩෝ රෙජිමේන්තු කඳවුර, ගණේමුල්ල
80. හුණුමුල්ල සිංහ රෙජිමේන්තු කඳවුර, දිවුලපිටිය
81. දොම්පෙ හමුදා ආරක්ෂක නිවස්නය

### ■ පොලිස් වධකාගාර

82. අපරාධ විමර්ශන බියුරෝව, ග්‍රෙගරි පාර, කොළඹ 07
83. පානදුර පොලිස් කාර්යාල ගොඩනැගිල්ල

වෙනත් පොලිස් වධකාගාර

84. විශේෂ කාර්ය බලකා මූලස්ථානය (වත්මන් ඔඩෙල් ප්‍රදර්ශනාගාරය), කොළඹ දිස්ත්‍රික්කය
85. පැලියගොඩ පොලිස් කාර්යාල ගොඩනැගිල්ල, කොළඹ දිස්ත්‍රික්කය
86. අම්පිටිය පොලිස් බැරැක්ක, මහනුවර දිස්ත්‍රික්කය
87. දිවුලපිටිය පොලිස් ස්ථානය, මහනුවර දිස්ත්‍රික්කය
88. බදුල්ල හාලිඇළ මෝටර්ස් ගොඩනැගිල්ල, (හමුදාව විසින්ද භාවිතා කෙරුණි)

**ප්‍රචණ්ඩ ක්‍රියා මර්දන ඒකකය**

89. ගම්පහ පොලිස් තනිකඩ නිවස්න, ගම්පහ දිස්ත්‍රික්කය

දෙමළ අතුරු හමුදා කණ්ඩායම්

90. සිවම් කෝවිලට යාබද ප්ලොට් කඳවුර, කෝවිල්කුලම්, වවුනියා
91. රම්බායිකුලම් ප්ලොට් කඳවුර, වවුනියා
92. යාපනයේ ස්ටැන්ලි පාරේ ශ්‍රීධර් සිනමා ශාලාවේ ඊපීඩීපී කඳවුර
93. කොළඹ 5, උද්‍යාන පාරේ ඊපීඩීපී කාර්යාලය
94. මලර් බේකරිය, වවුනියාව

### ► නාඳුනන අපරාධ කණ්ඩායම්වලට අයත් වධකාගාර

**මහනුවර දිස්ත්‍රික්කය**

95. කඩුගන්නාව පොලිස් ස්ථානයට යාබද ගොඩනැගිල්ල

**මොණරාගල දිස්ත්‍රික්කය**

96. මොණරාගල ප්‍රජා ශාලාව
97. මුතුකණ්ඩිය ව්‍යාපෘති කාර්යාලය, 4වැනි සැතැපුම් කණුව අසළ, මුතුකණ්ඩිය

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

98. වලපනේ වී අලෙවි මණ්ඩල ගබඩාව
99. නුවරඑළිය ශාන්ත රීටා කඳවුර
100. නුවරඑළිය නගර ශාලාව

**ගම්පහ දිස්ත්‍රික්කය**

101. කැළණිය සරසවි ක්‍රීඩාගාරය
102. මීරිගම තරුණ මධ්‍යස්ථානය
103. කැළණිය පට්ටිය හන්දිය, බිලියඩ් ශාලාව

**කෑගල්ල දිස්ත්‍රික්කය**

104. වික්‍රමසිංහ බංගලාව

මාතලේ දිස්ත්‍රික්කය

**මාතලේ දිස්ත්‍රික්කය**

105. සුනාත කඳවුර
106. කුඹියන්ගොඩ බෞද්ධ විහාරස්ථානය
107. මාතලේ නාගොල්ල පාරේ කාර්මික පුහුණු විද්‍යාලය

**කොළඹ දිස්ත්‍රික්කය**

108. රේස් කෝස්, රාජකීය විද්‍යාලයට යාබද, කොළඹ 7
109. සෙත්සිරිපාය ගොඩනැගිල්ල, බත්තරමුල්ල
110. ලේක්හවුස් පුවත්පත් ආයතනයේ බිම් මාලය, කොටුව
111. ටොරින්ටන් ඇවනියු, කොළඹ 7
112. කොළඹ නගර සභා මස් මඩුව, දෙමටගොඩ, කොළඹ 8
114. කොළඹ රාජකීය ගොල්ෆ් ක්‍රීඩා සමාජය, මොඩ්ල් ෆාම් පාර, කොළඹ 8

**රත්නපුර දිස්ත්‍රික්කය**

115. මහවැලි අධිකාරයේ සේවක නිවස්න, ඇඹිලිපිටිය ජාතික පාසැල ඉදිරිපිට

**කළුතර දිස්ත්‍රික්කය**

116. සොරණාතොට වතුයාය, සොරණාතොට
117. ගීකියනකන්ද වතුයාය, කළුතර
118. තානායම, මහගම
119. කෘෂිකර්ම මධ්‍යස්ථානය, බෝඹුවල
120. මිරිදිය හෝටලය, කළුතර

**ගාල්ල දිස්ත්‍රික්කය**

121. හිල්ටොප් හෝටලය, කළුවැල්ල

## 2006-2009

### ◆ "පුනරුත්ථාපන" කඳවුරු

**උතුරු පළාත**

122. ධර්මපුරම් සුබසාධන මධ්‍යස්ථානය
123. ගාමිණී මහා විද්‍යාලය
124. කෝවිල්කුලම් මහා විදුහල
125. මරදමඩු
126. නෙලුක්කුලම් කාර්මික විද්‍යාලය
127. ඕමන්තෙ විදුයාලය - මුලින් ත්‍රස්ත විමර්ශන ඒකකයේ රැඳවුම් මධ්‍යස්ථානය පසුව පුනරුත්ථාපන කඳවුර
128. පොම්පෙමඩු (හමුදා කඳවුර සහ පුනරුත්ථාපන කඳවුර)
129. පූන්තෝට්ටම් සමූපාකාර පුහුණු පාසැල/අධ්‍යාපන විද්‍යා පීඨය
130. පොතානිච්චූර් මුස්ලිම් වහා විදුහල
131. රම්බායිකුලම් ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය
132. දෙමළ මහා විද්‍යාලය
133. වෙල්ලිකුලම් මුස්ලිම් බාලිකා විදුහල

**නැගෙනහිර**

134. කන්දකාඩු, පොළොන්නරුව
135. වැලිකන්ද/සේනපුර කඳවුර

**අවතැන්වූවන්ගේ කඳවුර**

136. මැණික් ෆාම් සමාරෝධන කඳවුර, වවුනියාව

### ■ පොලිස්

**ත්‍රස්ත විමර්ශන ඒකකය**

137. බූස්ස කඳවුර, ගාල්ල

138. වවුනියාවේ ත්‍රස්ත විමර්ශන කඳවුර, (තේක්කවත්ත නමින් ප්‍රකටය)

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

139. හතරවැනි තට්ටුව, කොළඹ කොටුව, කොළඹ 1

140. වරාය රහස් පොලිස් ඒකකය, කොළඹ කොටුව

141. බොරැල්ල රහස් පොලිස් ගොඩනැගිල්ල, කොළඹ 8

142. රහස් පොලිස් බුද්ධි ඒකකය, කොටහේන පොලිස් ස්ථානය, කොළඹ 13

143. නුගේගොඩ රහස් පොලිස් කාර්යාලය, කොළඹ දිස්ත්‍රික්කය

144. චාවකච්චේරි රහස් පොලිස් කාර්යාලය, යාපනය දිස්ත්‍රික්කය

145. වල්ලිපුනම් රහස් පොලිස් කාර්යාලය, වන්නි දිස්ත්‍රික්කය

146. වවුනියා රහස් පොලිස් කාර්යාලය, වන්නි දිස්ත්‍රික්කය

147. කිලිනොච්චි රහස් පොලිස් කාර්යාලය, වන්නි දිස්ත්‍රික්කය

148. ඉරණමඩු හමුදා කඳවුර ඉදිරිපිට

149. මුලතිවු හමුදා කඳවුර රහස් පොලිස් ඒකකය, වන්නි දිස්ත්‍රික්කය

150. අම්පාර රහස් පොලිස් කාර්යාලය

151. කල්මුණෛ රහස් පොලිස් කාර්යාලය, අම්පාර දිස්ත්‍රික්කය

152. මුල්ලියාවලෛ රහස් පොලිස් කාර්යාලය, - මෙම ස්ථානයෙන් වෙනත් නාඳුනන ස්ථානයට පැහැරගන්නා ලදී, වන්නි දිස්ත්‍රික්කය

**<u>රාජ්‍ය බුද්ධි සේවා රහස් රැඳවුම් කඳවුරු</u>**

153. වවුනියාවේ වනගත ප්‍රදේශයක

154. ශ්‍රී මහා විහාරය, පන්සල පාර, කොළඹ

155. වත්තල දුම්රිය මාර්යට යාබද ස්ථානයක්, ගම්පහ දිස්ත්‍රික්කය

**<u>කොළඹ අපරාධ කොට්ඨාශය</u>**

156. කොලොන්නාව, කොළඹ දිස්ත්‍රික්කය

157. දෙමටගොඩ, කොළඹ දිස්ත්‍රික්කය

**<u>විශේෂ කාර්ය බලකාය</u>**

158. ගෝනහේන, කොළඹ දිස්ත්‍රික්කය

159. වෙට්ටිකුලම් විශේෂ කාර්ය බලකා කඳවුර, කොළඹ දිස්ත්‍රික්කය

**<u>පොලිස් ස්ථාන</u>**

160. බම්බලපිටිය පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

161. කොළඹ වරාය පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

162. හෙට්ටියාවත්ත පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

163. කොටහේන පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

164. ගල්කිස්ස පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

165. වැල්ලවත්ත පොලිස් ස්ථානය. කොළඹ දිස්ත්‍රික්කය

166. පිටකොටුව පොලිස් ස්ථානය, කොළඹ දිස්ත්‍රික්කය

167. සීදූව පොලිස් ස්ථානය, ගම්පහ දිස්ත්‍රික්කය

168. යාපනය පොලිස් ස්ථානය, යාපනය දිස්ත්‍රික්කය

169. නෙල්ලිඅඩි පොලිස් ස්ථානය, යාපනය දිස්ත්‍රික්කය

170. පදවිය පොලිස් ස්ථානය, අනුරාධපුර දිස්ත්‍රික්කය

171. පුල්මුඩේ පොලිස් ස්ථානය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

172. කඳාන පොලිස් ස්ථානය, ගම්පහ දිස්ත්‍රික්කය

## 1980 දශකය

*බලහත්කාරී පැහැරගැනීම් සහ අතුරුදහන්වීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තා (1995-2000), ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, ජේඩීඑස් වාර්තා සහ සාක්ෂි ප්‍රකාශ, ධර්මන් වික්‍රමරත්න විසින් පළකළ කෘති*

## 2009+:

*ITJP සාක්ෂි ප්‍රකාශ, 2010 ICJ වාර්තාව සහ පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශයේ ලැයිස්තුවල දැක්වෙන පුනරුත්ථාපන කඳවුරු*

● දෙමළ අතුරු හමුදා කණ්ඩායම්

173. නම් නොකරන ලද හෝටලයක් පිටුපස ඇති සිර මැදිරි, පානදුර, කළුතර දිස්ත්‍රික්කය

174. කලවන්චිකුඩි විශේෂ කාර්ය බලකා හා දෙමළ අතුරු හමුදා කල්ලි වධකාගාරය, මඩකළපු දිස්ත්‍රික්කය

175. තැඹිලිවිල්හි ඉනියභාරතීගේ කාර්යාල බිම් මහල, මඩකළපු දිස්ත්‍රික්කය

176. කිරාන් රැඳවුම් ස්ථානය, මඩකළපු දිස්ත්‍රික්කය

<u>හමුදා කඳවුරු</u>

<u>යාපන දිස්ත්‍රික්කය</u>

177. අච්චුවේලි හමුදා කඳවුර, යාපනය

178. කොඩිකාමම්හි අල්ලාරෛ කඳවුර

179. චාවකච්චේරි හමුදා කඳවුර, යාපනය

180. යාපන නගරයේ හමුදා කඳවුර

181. කන්කසන්තුරෛ නගරයට යාබද කීරිමලෛ හමුදා කඳවුර

182. තෙල්ලිප්පලෛ හමුදා හමුදා කඳවුර, යාපනය

183. පලාලි හමුදා කඳවුර, යාපනය

184. උඩුවිල් හමුදා කඳවුර

185. ඌරළු හමුදා කඳවුර, යාපනය

186. උරුම්පිරායි හමුදා කඳවුර, යාපනය

187. කයිතඩි මංසන්ධියේ හමුදා කඳවුර, යාපනය

<u>වන්නි දිස්ත්‍රික්කය</u>

188. කිලිනොච්චි හමුදා කඳවුර

189. කනගපුරම් හමුදා කඳවුර, කිලිනොච්චිය

190. ඉරණපාලෛ හමුදා කඳවුර, කිලිනොච්චිය

191. පරන්තන් මංසන්ධිය අසළ හමුදා කඳවුර, කිලිනොච්චිය

192. ඉයක්කච්චි හමුදා කඳවුර, අලිමංකඩ, කිලිනොච්චිය

193. ඉරණමඩු හමුදා කඳවුර, කිලිනොච්චිය

194. කේප්පාපුලවු හමුදා කඳවුර, මුලතිවු

195. මුලතිවු හමුදා කඳවුර

196. සම්පත් නුවර අවතැන් කඳවුර/හමුදා කඳවුර, මුලතිවු

<u>යුද්ධාවසානයේ යටත්වීම්</u>

197. උඩෛයාර්කාඩු මහා විදුහල කඳවුර, වන්නි

198. වල්ලිපුනම් විදුහල, වන්නි

199. කිලිනොච්චි රෝහල

<u>වවුනියා දිස්ත්‍රික්කය</u>

200. වෙප්පන්කුලම් හමුදා කඳවුර

201. ඕමන්තෛ විද්‍යාලය අසළ හමුදා කඳවුර

202. ජොසෙෆ් කඳවුර, වවුනියා නගරය

203. නකනගරායන්කුලම් හමුදා කඳවුර, වවුනියාව

අනුරාධපුර දිස්ත්‍රික්කය

204. තන්තිරිමලේ හමුදා දවුර, අනුරාධපුර

කොළඹ දිස්ත්‍රික්කය

205. පනාගොඩ හමුදා කඳවුර, කොළඹ

206. කොළඹ හමුදා කඳවුර

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය

207. ප්ලාන්ටන් පොයින්ට්, ත්‍රිකුණාමලය

208. ඕර්ස් හිල් හමුදා කඳවුර, ත්‍රිකුණාමලය

පොළොන්නරුව දිස්ත්‍රික්කය

209. මින්නේරිය හමුදා කඳවුර, පොළොන්නරුව

210. වැලිකන්ද ප්‍රධාන හමුදා කඳවුර, පොළොන්නරුව

211. වැලිකන්දසිට විනාඩි 30ක පමණ දුරින් පිහිටි වනගත කඳවුර (මරාදැමීම්)

<u>මඩකළපු දිස්ත්‍රික්කය</u>

212. මඩකළපු හමුදා පරිශ්‍රය (ට්‍රූත්පවුඩර් කඳවුර), ලේක් පාර

<u>අම්පාර දිස්ත්‍රික්කය</u>

213. අම්පාර - ප්‍රධාන හමුදා කඳවුර හෝ පුහුණු පාසැල නොවන, ඊට සමාන කුඩා හමුදා කඳවුරකි

● නාවික හමුදාව

214. ත්‍රිකුණාමලය නාවික ඩොක්යාඩ් කඳවුර

215. ත්‍රිකුණාමලය නාවික හමුදා ගන්සයිට් කඳවුර

216. නාවික කඳවුර, චෛත්‍යය පාර, කොළඹ

217. SLNS ගැමුණු කඳවුර, වැලිසර, ගම්පහ

218. පූනෑව කඳවුර (මැදවච්චිය සහ වවුනියා අතරමැද)

219. ත්‍රිකුණාමලය කෝණේස්වරම් කෝවිල පිටුපස, ෆ්‍රෙඩ්රික් කොටුවේ නාවික කඳවුර

***හඳුනානොගත් බහුවිධ ස්ථාන:*** *යාපන අර්ධද්වීපයේ නාවික කඳවුරක්, කොළඹ රහස් පොලිස් කාර්යාල ගොඩනැගිල්ලක්, වවුනියාවේ හමුදා කඳවුරක්, කොළඹ සහ වවුනියාවේ හඳුනානොගත් රහස් පොලිස් හා ත්‍රස්ත විමර්ශන පරිශ්‍රයන්, යාපනයේ හඳුනානොගත් හමුදා කඳවුරු, ත්‍රිකුණාමලයේ තවත් රැඳවුම් පරිශ්‍රයක්*

***මූලාශ්‍ර:*** *1980 දශකය: බලහත්කාරී පැහැරගැනීම් සහ අතුරුදහන්වීම් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව (1995-2000), ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, ජේඩීඑස් වාර්තා සහ සාක්ෂි ප්‍රකාශ, ධර්මන් වික්‍රමරත්න විසින් පළකළ කෘතිය (2009) / ITJP සාක්ෂි ප්‍රකාශ, 2010 ICJ වාර්තාව සහ පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාංශයේ ලැයිස්තුවල දැක්වෙන පුනරුත්ථාපන කඳවුරු*

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

JDS Journalists for Democracy in Sri Lanka

2020 ජූනි 18

## ඒකාබද්ධ ප්‍රවෘත්ති නිවේදනය: ශ්‍රී ලංකාවේ වධහිංසා සිතියම


W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA


**ජොහැන්නස්බර්ග්:** ජූනි 26 වැනිදාට යෙදෙන වධහිංසා වින්දිතයන්ට සහයෝගය පළකිරීමේ ජාත්‍යන්තර දිනය නිමිත්තෙන්, ශ්‍රී ලංකාවේ පළමු වධහිංසා සිතියම සම්පාදනය කිරීමට සංවිධාන දෙකක් විසින් ක්‍රියාකර තිබේ. පසුගිය දශක තුනක කාලය ඇතුළත දිවයින පුරා සිංහල, දෙමළ හා මුස්ලිම් ජනයා වධහංසාවන්ට පාත්‍ර කිරීමට යොදාගත් වධක ස්ථාන 219ක් එහි සළකුණු කොට දක්වා ඇත.

ස්වකීය සිතියම මගින් දිවයින පුරා සිදුවූ වධ හිංසාවන්ගේ පරිමාණය පූර්ණ වශයෙන් චිත්‍රණය නොකෙරෙන බව සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) හා ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) සංවිධානය සඳහන් කර සිටියි. ජනතා විමුක්ති පෙරමුණේ පළමු සහ දෙවැනි නැගිටීම් සිදුවූ වකවානුවල වධහිංසා පමුණුවීම සඳහා යොදාගත් පොලිස් ස්ථාන විශාල ප්‍රමාණයක් ඇති හෙයින් ඒවා මෙහි ඇතුළත් කර නොමැත. 2006 සිට 2019 දක්වා වූ කාලයට අදාළව සඳහන් කර ඇති ස්ථාන සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ සාක්ෂි ගොණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇති අතර එය ද කිසිසේත් පරිපූර්ණ එකක් නොවේ.

අසූව දශකයේ අපරභාගයේ දී වධහිංසා පමුණුවීම සඳහා යොදාගත් ස්ථාන අතරට විස්මයජනක ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨ ගොඩනැගිල්ල මෙන්ම ලේක් හවුස් ගොඩනැගිල්ලේ බිම් මාලය ද ඇතුළත් ය. දශක ගණනාවක් මුළුල්ලේ, ශ්‍රී ලංකාවේ පාසැල්, උසස් විද්‍යාල හා පුහුණු ආයතන විශාල සංඛ්‍යාවක් වධක ස්ථාන වශයෙන් යොදාගෙන ඇති අතර කර්මාන්ත ශාලා, ගොවිපොළ භූමි, සිනමා ශාලා, ක්‍රීඩාගාර හා ගොල්ෆ් පිටියක් පවා මෙසේ වධහිංසා පැමිණවීමට භාවිතා කර තිබේ.

"1987-89 වකවානුවේ සිංහල තරුණ ජනයා අතිශය ම්ලේච්ඡ වධහිංසාවන්ට ලක්කිරීමට හා ඝානය කිරීමට සන්නද්ධ හමුදාවන් විසින් යොදාගත් මෙම ස්ථාන මතකයෙන් මකා දමා ඇතැ"යි ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ සංවිධානයේ භාෂණ අබේවර්ධන ප්‍රකාශ කළේය. "ඕනෑම සමාජයක සාමූහික සදාචාර හෘදය සාක්ෂිය හැඩගස්වන්නේ හුදෙක් මිනිසුන් ජීවත්වෙන ආකාරයෙන් පමණක් නොව, නමුත් මිනිසුන් මිය යන ආකාරයත්, ඔවුන් ස්මරණය කෙරෙන ආකාරයත් විසිනුයි. ජීවත්වන්නවුන් විසින් මළවුන් අමතක කරන්නේ නම්, සමාජය භයානක වූ ප්‍රතික්ෂේප කිරීමක සිටින අතර එම සිදුවීම් නැවත සිදුවීමේ අවදානමට ද මුහුණ දෙයි."

1989දී, සිය ගජබා රෙජිමේන්තු ලුතිනන්වරුන් වූ (වත්මන් යුද හමුදාපති) ශවේන්ද්‍ර සිල්වා , (හිටපු හමුදා මාණ්ඩලික ප්‍රධානී) ජගත් ඩයස් සහ  (හිටපු නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි හා මෑතදී අමාත්‍යාංශ ලේකම් ධූරයකට පත් කළ) සුමේධ පෙරේරා යන කණිෂ්ඨ නිලධාරීන් සමග

මාතලේ දිස්ත්‍රික් හමුදා සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් කටයුතු කරන ලද්දේ කර්නල් ගෝඨාභය රාජපක්ෂ විසිනි. ජවිපෙ නැගිටීම සමයේ සිදු වූ දස දහස් සංඛ්‍යාත අතුරුදහන් වීම් පිළිබඳ පරීක්ෂණ පැවැත් වූ ආණ්ඩුවේ විමර්ශන කොමිසමක් විසින් සම්පාදනය කරන ලද මාතලේ දිස්ත්‍රික්කයේ අපරාධවලට වගකිවයුත්තන් 24 දෙනෙකුගේ නාම ලැයිස්තුවේ ද, "මාතලේ හමුදා කඳවුර භාර නිලධාරී, ජී. රාජපක්ෂ" යන නම සඳහන්ව තිබේ. මෙකී ලැයිස්තුව කිසි කලක ප්‍රසිද්ධ නොකෙරුණි.

මෙකී හමුදා නිලධාරීන්ටම ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් පිළිබඳ නීතීන් 2009දී බරපතල ලෙස උල්ලංඝනය කිරීමේ සිදුවීම්වලට හවුල්කාරී වූ බවට චෝදනා එල්ල වූ අතර පෙනෙන හැටියට ස්ථාපිත හමුදා ව්‍යුහයන්ට පිටින් ගෝඨාභය රාජපක්ෂගේ සෘජු ආඥාව හා අධිකාරය යටතේ 2009 යුද්ධය දියත් කිරීමේ කාර්යයේ ප්‍රධාන පුද්ගලයන් වශයෙන් ශවේන්ද්‍ර සිල්වා හා ජගත් ජයස් ක්‍රියා කළහ. ඔවුන් මෙසේ ක්‍රියාකරන ලද්දේ 1989 දී මාතලේ දිස්ත්‍රික්කයට යාබද බදුල්ල දිස්ත්‍රික්කයේ ජවිපෙ මැඩලීම සඳහා සම්බන්ධ වූ කමල් ගුණරත්න ද සමග ය.

"ජවිපෙ දෙවැනි නැගිටීම මැඩලීමට සම්බන්ධ වූ හමුදා නිලධාරීන්, පසුව පූර්ණ දණ්ඩ මුක්තිය සහිතව දෙමළ ජනයාට එරෙහි යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ සිදුකිරීමට කටයුතු කරන ලදැ"යි සත්‍යය සහ යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර ව්‍යාපෘතියේ විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා ප්‍රකාශ කළාය. "මානව හිමිකම් උල්ලංඝනයන් හා ඊට සම්බන්ධ පුද්ගලයන් සැළකූ විට 1989 සිට 2009 දක්වා සෘජු සම්බන්ධයක් පෙන්වා දිය හැකි"බව ඇය වැඩිදුරටත් කීවාය.  "ශ්‍රී ලංකාවේ වධහිංසා පැමිණවීම රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුවන බවටත්, එය රාජ්‍ය පිළිවෙත්වලට අදාළ ප්‍රධාන මෙවලමක් බවටත් කිසිදු සැකයන් නැති අතර, එකී පිළිවෙත රාජ්‍යයේ පූර්ණ අධිකාරය හා ව්‍යුහයන් යොදාගනිමින්  සෑම තලයකම ක්‍රියාවට නැංවීම සඳහා ආරක්ෂක හමුදා විසින් ක්‍රියා කර තිබේ" යැයි සූකා මහත්මිය කියා සිටියාය. "ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට නම්, අතීතයට අදාළ ගණුදෙනු බේරාගත යුතුව ඇති අතර, සියළු වින්දිතයන් පිළිගැනීමත්, ශ්‍රී ලංකාවේ දණ්ඩ මුක්තිය පිළිබඳ සංස්කෘතිය බිඳ දැමීමත් අවශ්‍ය වේ."

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT